# පනාවිටිය අම්බලමේ ලී කැටයම් පිළිබඳ අධ්‍යයනයක්

**රත්නායක ආර්.එම්.යූ.එන්.[1]**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ මයුරාවතී කෝරළයේ පිහිටි පනාවිටිය නම් ගම්මානයෙහි සොඳුරු වෙල්යායක ඉස්මත්තෙහි පනාවිටිය අම්බලම පිහිටා ඇත. පනාවිටිය අම්බලම වඩාත් ප්‍රසිද්ධියට පත් ව ඇත්තේ එහි දක්නට ලැබෙන කැටයම් අලංකරණ හේතුවෙනි. ගැමි ජනයාගේ දෛනික ජීවිතයෙහි විවිධ අවස්ථා මෙම කැටයම් මඟින් විදහාපායි. උදාහරණ ලෙස ආචාර සමාචාර දැක්වීම, පෙරහැර, නළඟන, මල්ලවපොර ශිල්පීන් හා බෙරකරුවන් ආදී නිර්මාණ සැකැස්මක පාර්ශවකරුවන් ඉතා උසස් ලෙස සැළකේ. කැටයම් කරන ලද පරාල තිස්දෙකක් මඩොල් කුරුපාව නමින් හැඳින්වෙන කැටයම්වලින් සමලංකෘත විශාල ලී ඇණය මඟින් එකට සම්බන්ධ වී අලංකාර කැණිමඩලක් වහළය මත නිමවා ඇත. වර්තමානයේ දක්නට ලැබෙන අම්බලමේ වහලය සෙවිලි කර ඇත්තේ පෙති උළුවලිනි. කැටයම් අතරෙහි මිනිස් රූප හා සත්ත්ව රූප ද මල් හා කොළ ආදිය ද වේ. අම්බලමේ ලී කැටයම්වල නාග රූපයට විශේෂත්වයක් හිමිවූයේ ප්‍රධාන කණුවෙහි ජනේලයට ඉහළින් කැටයම්වල තිබෙන දඟර ගැසෙමින් යන නාගයන් සිව්දෙනාගේ කැටයමිනුත් නාග දඟරය කැටයමිනුත් පෙනේ. මෙහි නාග කැටයම් 45කි. ඉදිරිපස බාල්කයේ වෙස් නැට්ටුවා, ගැටබෙරය හා වයන බෙරකරු උඩරට කලා සම්ප්‍රදායන් විදහාපායි. ක්‍රියාශීලීත්වය හා සමබර බව මනාව විදහාපාලන මල්ලවපොර ශිල්පීන් දෙදෙනාගේ කැටයම උඩයට මාරු කර බැලුවත් එකම අයුරින් සිටින පරිදි කැටයම් කිරිම මෙහි නිර්මාණ ශිල්පියෙකුගේ කෘතහස්තභාවය විදහාපාන්නකි. අම්බලමේ ජනේල කැටයම්වල සත්ත්ව රූප අතර සිංහයා, නාගයා ,මුවා, මුවදෙන, මොනරා, සෙබඩ හා ඇතා වැනි කල්පිත සත්ත්ව මෝස්තර වේ. ගරුඬ පක්ෂියාගේ කැටයම මෙහි එකම මනංකල්පිත රූපය වේ. මෙහි මෝස්තරකරණ කැටයම් කරන අතර මල් මෝස්තරයන්ට ද විශේෂත්වයක් හිමිවන්නේ ය. ඒ අතරින් නෙළුම් මල ප්‍රමුඛස්ථානයෙහි ලා ගැනෙන අතර අම්බලමේ දක්නට ලැබෙන මුළු නෙළුම් මල් කැටයම් හතලිස් පහකි. ඒ අතර පිපුණ මල් පොහොට්ටු , පෙති හැලුණු නෙළුම් මල සහිත පේකඩ සැරසිලි ද අම්බලමේ කැටයම් අතර විශිෂ්ට නිර්මාණාත්මක නිර්මාණ ලෙස සැළකේ. ලියවැල, ලණුගැටය ආදී සංකේත දැකිය හැකි කැටයම් මෝස්තර ද පනේල කැටයම් අතර දක්නට ලැබේ. අම්බලමේ කැටයම් අතර මිනිස් රූපයක්, සක් පිඹින්නන්, නලා පිඹින්නන්, ඇත් ගොව්වන් දෙදෙනෙක්, කාන්තාවන් දෙදෙනෙක්, අංගම්පොර දෙදෙනෙක්, නාට්‍යකරුවන් හතරක්, නැට්ටුවන් දෙදෙනෙක් ලෙස වර්ගීකරණය කළ හැකිය. නයිගැට කැටයම් ආදි කැටයම් මඟින් අම්බලමේ ලී කැටයම්වල විශිෂ්ටත්වය මනා ලෙස කියාපායි.

**මුඛ්‍ය පද :** ගරුඩ රූපය, මල්ලවපොර, බොරදම්, ගැටබෙරය, නළඟන රුව

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. sanurathna123@gmail.com